C
373
GAM

# ' පරීක්ෂණ වර්ග හා අධ්‍යයන පුරුදු ' පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ඒ. එස්. ගමගේ (බී. ඒ., අධ්‍යා. ඩිප්. සම්මාන)

අධ්‍යාපන ශාස්ත්‍රපති පරීක්ෂණයේ අර්ධ පූර්ණයක් වශයෙන්

පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට

ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධනයයි

1 9 8 7

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

නිබන්ධන උපදේශක :

ආචාර්ය මොහොට්ටිගේ උපාලි සේදර, (එම්. ඒ., පී. එච්. ඩී)

අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය.

412838

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

## සාරාංශය

ශ්‍රී ලංකාවේ පාසල්වල සිසුන් ගේ අධ්‍යයන පුරුදු පිළිබඳව කරනලද මෙම අධ්‍යයනයේ දී රචනා වර්ගයේ පරීක්ෂණ, ව්‍යුහගත වර්ගයේ පරීක්ෂණ සහ බහුවරණ වර්ගයේ පරීක්ෂණ යන පරීක්ෂණ වර්ග තුනට සූදානම්වීමේදී සිසුන් ව්‍යවහාරයට ගනු ලබන අධ්‍යයන පුරුදු වෙසෙසි ලෙස වෙනස්වන්නේ දැයි විමසීමට ලක් කරන ලදී.

කුඩා නියැදියකට දෙන ලද නියාමක පරීක්ෂණයක් මඟින් සිසුන් ගේ තේරීම මත හඳුනාගත් අධ්‍යයන පුරුදු දාහතරක් මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කරගනු ලැබිණි.

මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සහ අර්ධ නාගරික යන දෙවර්ගයෙන් තෝරාගත් පාසල් දෙකකින් සාමාන්‍ය අහඹු පිළිවෙලට ගත් දහවැනි වසරේ (නවවැනි ශ්‍රේණියේ) සිසුන් පනස් දෙකකින් යුතු නියැදියක් පර්යේෂණය සඳහා යොදාගන්නා ලදී.

දත්ත රැස්කිරීම සඳහා පර්යේෂකයා විසින් දහවැනි වසරේ (නවවැනි ශ්‍රේණියේ) සමාජ අධ්‍යයන විෂයෙන් රචනා, ව්‍යුහගත සහ බහුවරණ යන පරීක්ෂණ වර්ග තුනට අදාලව පරීක්ෂණ නවයක් සකස් කරනු ලැබූ අතර, එය 'විශේෂ පරීක්ෂණය' යනුවෙන් නම් කෙරේ. මහනුවර දිස්ත්‍රික්කයේ විදුහල්වල දහවැනි වසරේ (නවවැනි ශ්‍රේණියේ ) ළමුන් සඳහා 1985 නොවැම්බර් මස පවත්වන ලද වාර්ෂික පරීක්ෂණයද උපයෝගී කරගන්නා ලදී. එය මෙහිදී 'වාර පරීක්ෂණය' යනුවෙන් නම් කෙරේ. ඒ හැර දත්ත රැස් කිරීමේදී පිළිවෙත් දෙකක් උපයෝගී කරගනු ලැබිණි. එම පිළිවෙත් දෙක මෙහිදී 'ඍජු පිළිවෙත' සහ 'වක්‍ර පිළිවෙත' යනුවෙන් නම් කෙරේ.

'ඍජු පිළිවෙත' සහ 'වක්‍ර පිළිවෙත' යටතේ වාර පරීක්ෂණය සහ විශේෂ පරීක්ෂණය යන අවස්ථා දෙකෙහිදීම රචනා පරීක්ෂණ, ව්‍යුහගත පරීක්ෂණ සහ බහුවරණ පරීක්ෂණ-

වලට වෙන් වෙන් වශයෙන් අදාල වනයේ අධ්‍යයන පුරුදු තරා පටිපාටින් ගණනය කරන ලදී.

පරීක්ෂණ තුන් වර්ගයට අදාල අධ්‍යයන පුරුදු හා බැඳී කරුවන් අතර වාර පරීක්ෂණයට හා විශේෂ පරීක්ෂණයට සම්බන්ධව, "සෘජු පිළිවෙත" සහ "වක්‍ර පිළිවෙත" යන බෙදුම් මත සහ සම්බන්ධතා සංගුණකයන් ගණනය කරන ලදී.

වාර පරීක්ෂණය සහ විශේෂ පරීක්ෂණය යන පරීක්ෂණ අවස්ථා දෙක යටතේ ම "සෘජු පිළිවෙතට" සහ "වක්‍ර පිළිවෙත" ට අදාලව එක් එක් අධ්‍යයන පුරුද්ද හා බැඳී ආන්තර ලකුණුගත සමාන්තර මධ්‍යන්‍යයන්ගේ වෙසෙසියාව ද ගණනය කරනු ලැබිණි.

සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණය අනුව සමස්තයක් වශයෙන් ගෙන බලනවිට, පර්යේෂණයේදී යොදා ගත් අධ්‍යයන පුරුදු 14 න් ඉතා සුළු සංඛ්‍යාවක් හැර සෙසු සියල්ලම පරීක්ෂණ වර්ග අතර වෙසෙසි වෙනසක් නොපෙන්වන බැවින්ද, රචනා, බහුවරණ සහ ව්‍යුහගත යන පරීක්ෂණ වර්ග තුනට සූදානම් වීමේදී සිසුන් ව්‍යවහාරයට ගනු ලැබූ අධ්‍යයන පුරුදු දායකරම් ඉතා ළඟ සහ සම්බන්ධිත බවක් දක්වන බැවින් ද, පර්යේෂකයා මෙම අධ්‍යයනය සඳහා යොදාගනු ලැබූ :

"රචනා බහුවරණ සහ ව්‍යුහගත යන පරීක්ෂණ වර්ග තුනට සූදානම් වීමේදී සිසුන් උපයෝගී කරගනු ලබන අධ්‍යයන පුරුදු අතර වෙනසක් ඇත"

යන මූලික උපකල්පනය සම්බන්ධයෙන් ලැබී ඇති සාක්ෂ්‍ය අල්ප බව පෙන්වා දිය හැකිවේ.